**ශීර්ෂය 222 - ශ්‍රී ලංකා යුද්ධ හමුදාව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2015 වර්ෂය**

---

ශීර්ෂය 222 - ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2016 ජුලි 30 දින ශ්‍රී ලංකා යුද්ධ හමුදාධිපති වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

---

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

-------

**2.1 විසර්ජන ගිණුම**

----------------

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

---------------------------

ශ්‍රී ලංකා යුද්ධ හමුදාව සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 159,814.90 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 158,351.34 ක් උපයෝජනය කර තිබුණි. ශ්‍රී ලංකා යුද්ධ හමුදාව වෙත සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 1,463.56 ක් හෙවත් සියයට 0.92 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| **වියදම** | **2015 දෙසැම්බර් 31දිනට** | | | **ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස** |
|---|---|---|---|---|
| | **ශුද්ධ ප්‍රතිපාදනය** | **උපයෝජනය** | **ඉතිරිය** | |
| | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | |
| පුනරාවර්තන | 151,629.47 | 151,624.69 | 4.78 | 0.003 |
| මූලධන | 8,185.43 | 6,726.65 | 1,458.78 | 17.821 |
| **එකතුව** | **159,814.90** | **158,351.34** | **1,463.56** | **0.916** |

**2.2 අත්තිකාරම් ගිණුම**

**2.2.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

ශ්‍රී ලංකා යුද්ධ හමුදාවට අදාල විෂය අංක 22201 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ .

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| **උපරිම සීමාව** | **තථ්‍ය** | **අවම සීමාව** | **තථ්‍ය** | **උපරිම සීමාව** | **තථ්‍ය** |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 2,605 | 2,353 | 2,229 | 2,959 | 4,000 | 1,502 |

**2.3 අග්‍රිම ගිණුම**

ශ්‍රී ලංකා යුද්ධ හමුදාව යටතේ වූ අග්‍රිම ගිණුමේ 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.මිලියන 528 ක් විය.

**2.4 පොදු තැන්පත් ගිණුම**

ශ්‍රී ලංකා යුද්ධ හමුදාව යටතේ වූ අංක 6000/0000/00/0015/0103/000 දරන පොදු තැන්පතු ගිණුමේ 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.මිලියන 138 ක් විය.

**2.5 විගණන නිරීක්ෂණය**

ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

**3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ**

**3.1 අයවැය විචලනය**

ඉන්දියානු ණය යෝජනා ක්‍රමය යටතේ ලබා ගෙන තිබුණු ණය ආධාර උපයෝජනය කිරීම සඳහා උප වැය විෂයයන් 04 ක් යටතේ රු.මිලියන 2,604.00 ක ප්‍රතිපාදන සලසා තිබුණි. සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 871.20 ක් උපයෝජනය කළ පසු රු.මිලියන 1,732.80 ඉතිරි වී තිබුණි. එම ඉතිරිය සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 53 ක සිට සියයට 100 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි.

## 3.2 අග්‍රිම ගිණුම්

---------------

ශ්‍රී ලංකා යුද්ධ හමුදාව විසින් 2016 අප්‍රේල් 30 දින වන විට පියවා නොතිබුණු අග්‍රිම ශේෂවල එකතුව රු. මිලියන 23.40 ක් වී තිබුණි. ඉන් එකතුව රු. මිලියන 2.81 ක්වූ ශේෂ 2008 පෙබරවාරි 18 දින සිට පැවැත එමින් තිබුණි.

## 3.3 පොදු තැන්පත් ගිණුම

----------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වර්ෂ 2 ක් ඉක්මවූ එකතුව රු. මිලියන 2.64 ක්වූ තැන්පතු 165 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ආ) වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් විවිධ කාර්යයන් සඳහා ලබාදී තිබුණු රු.මිලියන 63.91 ක් අදාළ කාර්ය භාරයන් ඉටු නොකර තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබුණි.

## 3.4 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

-----------------------------------------------------------------

විෂය අංක 22201 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම ගිණුම පිළිබඳ විගණනයට ඉදිරිපත් කළ 2015 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව, එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු. මිලියන 401.34 ක් වූ අතර, එම හිඟහිටි ශේෂ වර්ෂ 01 ක සිට වර්ෂ 05 ක් දක්වා කාල පරාසයක සිට පැවැත එමින් තිබුණත්, එම ණය ශේෂ අයකර ගැනීමේ පසුවිපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවැතුණි

## 3.5 බේරුම් නොකළ බැරකම්

------------------------------

ශ්‍රී ලංකා යුද්ධ හමුදාව විසින් 2015 දෙසැම්බර් 31 දිනට බේරුම් නොකළ වර්ෂයකට වඩා අඩු කාලයක සිට පැවැත එන බැරකම් රු. මිලියන 4,273.49 ක් විය.

## 3.6 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

----------------------------------

2014 හා 2015 වර්ෂවල දී පවත්වන ලද විවිධ රාජ්‍ය, ආගමික හා වෙනත් උත්සව කටයුතු සඳහා රු. මිලියන 8.86 ක් වටිනා භාණ්ඩ කිසිදු අනුමැතියකින් තොරව ශ්‍රී ලංකා යුද්ධ හමුදා 12 වන ඉංජිනේරු සේවා බලසනය විසින් නිකුත් කර තිබූ බව නියැදි විගණන පරීක්ෂණ වලදී අනාවරණය විය.

## 3.7 අවිධිමත් ගනුදෙනු

----------------------

ශ්‍රී ලංකා යුද්ධ හමුදාව විසින් එළඹ තිබුණු සමහර ගනුදෙනු විධිමත් බවින් තොර විය. නිරීක්ෂණය වූ එවැනි අවස්ථා කිහිපයක් පහත දැක්වේ

**රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ක්‍රියා පටිපාටියෙන් බැහැරවීම**

------------------------------------------------------------------

පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

(අ) 2014 ජනවාරි 07 දින කවර් අවුටර්ස්, ටියුබ් ඉනර් සහ මෆ්ලර් සෙට් 96 ක් රු.මිලියන 8.55 කට මිලදී ගැනීම සම්බන්ධයෙන් පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

(i) තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් නිර්දේශ ලබාගෙන අවම මිල ගණන් ඉදිරිපත් කළ ආයතනයක ටෙන්ඩරය ප්‍රතික්ෂේප කර ඉහල මිල ගණන් ඉදිරිපත් කළ ආයතනයකින් භාණ්ඩ මිල දී ගැනීමට තීරණය කර තිබීම නිසා රු. මිලියන 4.59 ක් වැඩිපුර ගෙවීමට සිදුවී තිබුණි.

(ii) ඉහත මිලදී ගැනීමේදී ඒකක 80 ක් සහ 16 ක් වශයෙන් දෙවතාවකට ඇණවුම් කර තිබූ අතර අවස්ථා දෙකහිදීම භාණ්ඩ සැපයීම පිළිවෙලින් දින 30 ක් සහ දින 180 ක් වශයෙන් ප්‍රමාද කර තිබුණි. ඒ අනුව සැපයුම්කරුගෙන් අයකර ගත යුතුව තිබූ රු.454,701 ක ප්‍රමාද ගාස්තු අයකර ගැනීමටද කටයුතු කර නොතිබුණි.

(ආ) ප්ලාස්ටික් ලිපිගොනු කවර 168460 ක් රු. මිලියන 50.00 කට මිලදී ගැනීම සම්බන්ධයෙන් පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

(i) ලිපිද්‍රව්‍ය ගණනයට වැටෙන ලිපිගොනු කවර මිල දී ගැනීම සඳහා වියදම පුනරාවර්තන වියදම් යටතේ ගිණුම්ගත කළ යුතු වුවත්, එය මූලධන වියදම් යටතේ ගිණුම්ගත කර තිබුණි.

(ii) ඉහත මිලදී ගැනීම සඳහා මිල ගණන් කැඳවීමේදී එක් සැපයුම්කරුවකු පමණක් මිල ගණන් ඉදිරිපත් කර තිබුණු අතර රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7.12.1 මාර්ගෝපදේශය ප්‍රකාරව, ලැබී තිබුණු ලංසුව ප්‍රතික්ෂේප කර නැවත මිල ගණන් කැඳවීමට හෝ 7.12.2 මාර්ගෝපදේශය ප්‍රකාරව, ලැබුණු මිල ගණන් සාධාරණ ද යන්න පරීක්ෂාකර බලා සැපයුම්කරු විමසා මිල ගණන් අඩුකර ගැනීමට කටයුතු කර හෝ නොතිබුණි.

(iii) මිල ගණන් ඉදිරිපත් කරන ලද එකම සැපයුම්කාර ආයතනය තනිපුද්ගල ව්‍යාපාරයක් වූ අතර ලංසුව ඉදිරිපත් කිරීමේදී, ගිවිසුම් අත්සන් කිරීමේදී සහ භාණ්ඩ සැපයීමේදී හා බිල්පත් ඉදිරිපත් කිරීමේදී ආයතනයේ හිමිකරු ලෙස විවිධ පුද්ගලයින් අත්සන් තබා තිබුණි. ඒ අනුව ආයතනයේ නිවැරදි හිමිකරු (සැපයුම්කරු) හඳුනා ගැනීම මතභේදාත්මක වී තිබුණි.

(iv) ශ්‍රී ලංකා යුද්ධ හමුදාවට ඉකුත් වර්ෂවලදී භාණ්ඩ සැපයු එකතු කළ අගය මත බදු වංචා කිරීම සහ නියමිත පරිදි , නියමිත දිනයට භාණ්ඩ සැපයීමට අපොහොසත් වූ ආයතන දෙකක හිමිකරු විසින්ම වෙනත් ආයතනයක නමින් ලිපිගොනු කවර සැපයීම සඳහා ද ඉදිරිපත් වී ඇති බව අනාවරණය වී තිබියදීත් එම සැපයුම්කරුට ටෙන්ඩරය පිරිනමා තිබුණි.

(v) සැපයුම්කරු සමඟ අත්සන් කළ කොන්ත්‍රාත් ගිවිසුමෙහි 8.2 වගන්තිය ප්‍රකාරව, භාණ්ඩ සැපයීම දින 30 කට වඩා ප්‍රමාදවීම කොන්ත්‍රාත්තුව නතර කිරීමටත් කාර්යසාධන ඇපකරය රාජසන්තක කිරීමටත් හේතුවන බව දක්වා තිබියදීත් භාණ්ඩ සැපයීමට මාස 08 කට අධික කාලයක් ප්‍රමාද කළ ඉහත සැපයුම්කරු සම්බන්ධයෙන් ගිවිසුම ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(vi) සැපයුම සඳහා ගිවිසුම අත්සන් කළ තැනැත්තියගේ එකතු කළ අගය මත බදු ලියාපදිංචි අංකය අක්‍රීය අංකයක් බවත්, සැපයුම්කාර ආයතනය එකතු කළ අගය මත බදු ගෙවීම සඳහා ලියාපදිංචි වී නොමැති බවත් දේශීය ආදායම් කොමසාරිස්වරයා විසින් තහවුරු කර තිබියදීත්, ඉහත සැපයුම්කරු වෙත රු. මිලියන 5.36 ක් එකතු කළ අගය මත බදු ලෙස ගෙවා තිබුණි.

(ඇ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3 වන මාර්ගෝපදේශය ප්‍රකාරව භාණ්ඩයක් හෝ සේවයක් මිලදී ගැනීමේදී එහි දක්වා ඇති ප්‍රසම්පාදන ක්‍රම අනුගමනය කර මිලදී ගැනීම සිදුකළ යුතු වුවත්, එම පරිපාටියෙන් බැහැරව රු.මිලියන 2.08 ක මාසික කුලී ගෙවීමක් කළයුතු ගොඩනැගිල්ලක් කුලියට ගෙන තිබුණි.

**3.8 කළමනාකරණ දුර්වලතා**

----------------------------

2014 වර්ෂයේ ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මට අනුව සංගීත උපකරණ මිලදී ගැනීම සඳහා රු. මිලියන 24.00 ක ප්‍රතිපාදන සලසා තිබුණි. රෙජිමේන්තු 20 ක් වෙනුවෙන් අවශ්‍ය සංගීත උපකරණ මිල දී ගැනීම සඳහා පමණක් රු. මිලියන 36.13 ක් වැය කර තිබුණි. ඉහත මිලදී ගැනීම සම්බන්ධයෙන් පහත අඩුපාඩු අනාවරණය විය.

(අ) වෙළඳපල මිල සැඳහුම් ක්‍රමය භාවිතා කර රෙජිමේන්තු ආයතන සභාපති අරමුදලින් ඉහත සඳහන් සංගීත උපකරණ රු.මිලියන 36.13 කට මිලදි ගෙන තිබුණි. පසුව එම ගෙවීම් රජයේ අරමුදලින් ප්‍රතිපූරණය කර තිබුණි. ඒ අනුව ඉහත මිලදී ගැනීම රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධානයන්ට පටහැනිව සිදුකර තිබුණි.

(ආ) 2013 වර්ෂයේ පැවැත්වුණු විජයග්‍රහණ පෙළපාලි උත්සවය සඳහා හදිසි අවශ්‍යතාවයක් සේ සලකා ඉහත මිලදී ගැනීම සිදුකර තිබුණි. එහෙත් රෙජිමේන්තු 18 ක් 2013 වර්ෂයේ මැයි මාසයේ දී පෙළපාලිය පැවැත්වුණු දිනට පෙර භාණ්ඩ ලබාගැනීමට අපොහොසත් වී තිබුණි.

(ඇ) ඉහත පරිදි මිලදී ගත් භාණ්ඩ සියල්ල එක් මිලදී ගැනීමක් ලෙස මිලදී ගැනීමට කටයුතු කළේ නම් සැපයුම්කරුගෙන් වට්ටම් වාසි සහිතව මිලදී ගැනීමට හැකියාව තිබුණු බව නිරීක්ෂණය විය.

(ඈ) ඉහත මිලදී ගැනීම යටතේ ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ සන්නාහ සන්නද්ධ බලකායට අයත් මෝදර රොක්හවුස් කඳවුරට මිලදී ගන්නා ලද රු.1,797,600 ක් වටිනා භාණ්ඩ 2015 නොවැම්බර් 03 දින සිදුකළ භෞතික පරීක්ෂාවේ දී සංගීත භාණ්ඩ ගබඩාවේ භෞතිකව නොතිබුණි.

(ඉ) 2013 දෙසැම්බර් 19 දින රෙජිමේන්තු ආයතන සභාපති අරමුදලින් ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරව රු.543,550 ක සෝෆා සෙට් 03 ක් මිල දී ගෙන පසුව රජයේ අරමුදල්වලින් ප්‍රතිපූරණය කර තිබුණි.

**3.9 මානව සම්පත් කළමනාකරණය**

------------------------------------

**(අ) අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

**-----------------------------------------------------**

2015 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ සේවය කරනු ලැබූ නිලධාරී හා සෙසු නිල සංඛ්‍යාව

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | නිලධාරී - නිත්‍ය /ස්වේච්ඡා | 10,641 | 9,654 | 987 |
| (ii) | සෙසුනිල - නිත්‍ය/ස්වේච්ඡා | 189,719 | 172,307 | 17,412 |
| | **එකතුව** | **200,360** | **181,961** | **18,399** |

ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ සේවය කරනු ලැබූ සිවිල් කාර්ය මණ්ඩල සේවක සංඛ්‍යාව

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 11 | 09 | 02 | - |
| (ii) | තෘතියික මට්ටම | 06 | 02 | 04 | - |
| (iii) | ද්විතියික මට්ටම | 198 | 150 | 48 | - |
| (iv) | ප්‍රාථමික මට්ටම | 6,386 | 9,629 | - | 3,243 |
| (v) | වෙනත් (අනියම්/තාවකාලික/ කොන්ත්‍රාත් පදනම) | 4,537 | 1,188 | 3,349 | - |
| | **එකතුව** | **11,138** | **10,978** | **3,403** | **3,243** |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) බඳවා ගෙන තිබුණු අතිරික්ත සේවක සංඛ්‍යාව පිළිබඳව විධිමත් අනුමැතියක් ලබාගැනීමට ශ්‍රී ලංකා යුද්ධ හමුදාව කටයුතු කර නොතිබුණි.

(ii) සමාලෝචිත වර්ෂය අවසාන වන විට අනුමත කාර්ය මණ්ඩලයෙන් පුරප්පාඩු 21,802 ක් පැවැති තිබුණි. ශ්‍රී ලංකා යුද්ධ හමුදාව විසින් එම පුරප්පාඩු විධිමත් පරිදි පිරවීමට කටයුතු නොකර, සේවකයින් 1,188 ක් අනියම් කාර්ය මණ්ඩලය ලෙස බඳවා ගෙන තිබුණි.